(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 100.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2016 සැප්තැම්බර් මස 20 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

375/'15

1.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) වර්ෂ 2005 සිට 2015 දක්වා වසරවල එක්සත් ජාතීන්ගේ මහ සමුළුවට (General Assembly) සහභාගී වූ ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායම්වල,

(i) ප්‍රධානත්වය දැරුවේ කවුරුන්ද;

(ii) නියෝජිතයන් සංඛ්‍යාව කවරේද;

(iii) ඒ අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සිටියේ නම්, ඔවුන්ගේ නම් කවරේද;

(iv) විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) වැය කළ මුළු මුදල කොපමණද;

(vi) එම වියදම ගුවන් ගමන්, හෝටල් හා නවාතැන් වියදම් ලෙස එක් එක් ශීර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

530/'16

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය අවසන් වනවිට ශ්‍රී ලංකාව තුළ එළකිරි නිෂ්පාදනය තම ජීවිකාව කරගත් පිරිස කොපමණද;

(ii) 2015 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ එළකිරි නිෂ්පාදනය ලීටර් කොපමණද;

(iii) 2015 වසර අවසානයේදී ශ්‍රී ලංකාව තුළ සිටි එළ දෙනුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එළකිරි කර්මාන්තයේ නිරතවන්නන්ට එම කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය පහසුකම් රජය විසින් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම පහසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එළ දෙනුන්ගේ ගහනය වැඩි කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

608/'16

3.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) හමුදා සාමාජිකයන්ගේ දරුවන් සඳහා වූ පාසල්වලට, නිලධාරින් නොවන යුද හමුදා සාමාජිකයන්ගේ දරුවන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් පසුගිය රජය විසින් සකස් කරන ලද ප්‍රතිපත්ති කවරේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

736/'16

4.

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2013, 2014 සහ 2015 වර්ෂවල කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ,

(i) ලියාපදිංචිව තිබූ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් (ETF) ගිණුම් සංඛ්‍යාව;

(ii) අලුතින් ලියාපදිංචි වූ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් (ETF) ගිණුම් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2013, 2014 සහ 2015 වර්ෂවල අලුතින් ලියාපදිංචි වූ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් (ETF) ගිණුම් සංඛ්‍යාව,

(i) රජයට අයත් සමාගම්;

(ii) අර්ධ රාජ්‍ය ආයතන;

(iii) පෞද්ගලික අංශය;

(iv) කර්මාන්ත අංශය;

(v) කෘෂිකර්මාන්ත අංශය;

(vi) සේවා අංශය;

අනුව සහ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

787/'16

5.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය රජයේ දිවිනැගුම ව්‍යාපෘතිය මඟින් රුපියල් මිලියන 100ක වියදමින් මරදගහමුල අක්කර 5ක භූමියක රුපියල් කෝටි 100ක පමණ වටිනා වී තොග ගබඩා කළ හැකි සහල් ගබඩා සංකීර්ණයක් ඉදිකළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එහි ගබඩා කර ඇති වී තොග ප්‍රමාණය කොපමණද;

(ii) මෙම ගබඩාවට සම්බන්ධවී කටයුතු කරන ව්‍යාපාරිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ගබඩාවේ සහල් අලෙවි කිරීමේ කටයුතු පිළිබඳව වෙළඳ සංගමය සමඟ සාකච්ඡා කර තිබේද;

(iv) මෙහි අවසන් වරට ගබඩා කර තිබූ වී තොග ප්‍රමාණය කොපමණද;

(v) එම වී තොග අලෙවි කරන ලද්දේ කවුරුන් හට කුමන වකවානුවේද;

(vi) මෙම ගබඩාවෙන් පූර්ණ උපයෝජනයක් ලබා ගැනීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

802/'16

6.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය කාලවකවානුවේ උතුරු පළාතෙහි ඇතිවූ යුද්ධය හා අනෙකුත් ආපදා හේතුවෙන් ආබාධිත තත්ත්වයට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) උතුරු පළාතේ ආබාධිතයන් සඳහා වන මාසික දීමනාව ලබන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ආබාධිත තත්ත්වයට පත්ව සිටියදීත්, කිසිදු දීමනාවක් නොලබන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආබාධිත පුද්ගලයන් සඳහා ලබාදෙන දීමනාව, සියලුම ආබාධිත පුද්ගලයන්ට ලබාදීමට පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

811/'16

7.

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් වත්මන් ප්‍රධාන අමාත්‍යවරයා එම තනතුරට පත්වීමෙන් පසු පළාත් සභාවේ විවිධ ආයතනවලට මේ දක්වා ලබා දී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුද්ගලයන්ගේ නම් හා රැකියා ලබා දී ඇති ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) රැකියා ලබා දීම සඳහා අනුගමනය කර ඇති ක්‍රියාමාර්ගය කවරේද;

(iv) එම රැකියා අවස්ථා දේශපාලන පක්ෂ භේදයකින් තොරව ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

820/'16

8.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සේනානායකපුර ග්‍රාම නිලධාරි වසමේ, ඩී. එස්. සේනානායක වීදියේ, 4 වන මාවතේ සිතියම් අංක 280007 සහ කැබලි අංක 686 සහ බලපත්‍ර අංක අම්/වා/බ 1369 දරන ඉඩමෙහි සෝමදාස සෙල්ලහේවා යන අය විසින් වෙළඳසලක් පවත්වාගෙන ගිය බවත්;

(ii) 1991 වර්ෂයේදී මෙම ඉඩම පොදු කටයුත්තක් සඳහා රජයට පවරා ගත් බවත්;

(iii) එහි පොදු කටයුත්තක් සිදු නොවූ බැවින්, අම්පාර සහකාර ඉඩම් කොමසාරිස් විසින් වසර 30ක් සඳහා තක්සේරු කර රු.171,050/-ක් සහ මිනින්දෝරු ගාස්තු වශයෙන් රු.1,450/-ක් ලබාගෙන නැවත සෝමදාස සෙල්ලහේවා මහතාට ඉඩම භුක්ති විඳීමට අවසර ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි සඳහන් ඉඩම සෝමදාස සෙල්ලහේවා මහතාට අයත් ඉඩමක්ද;

(ii) එම ඉඩමේ විශාලත්වය කොපමණද;

(iii) එහි වෙළඳසලක් පවත්වාගෙන යන ලද්දේ කවර දිනයක සිට කවර දිනයක් දක්වාද;

(iv) එම ඉඩම රජයට පවරා ගැනීමක් සිදු කර තිබේද;

(v) එම ඉඩම පවරා ගන්නා ලද්දේ කුමන පොදු කටයුත්තක් සඳහා ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

536/'16

9.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හෙරොයින් ඇතුළු වෙනත් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් පිළිබඳ සංගණනයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම පුද්ගලයන් අතරින් HIV ආසාදිතයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් අතර HIV ඇතුළු සමාජ රෝග ව්‍යාප්තවීම පාලනය කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

737/'16

10.

ගරු බිමල් රත්නායක මහතා,— කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2013, 2014 සහ 2015 වර්ෂවල කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ,

(i) ලියාපදිංචිව තිබූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

(ii) අලුතින් ලියාපදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2013, 2014 සහ 2015 වර්ෂවල අලුතින් ලියාපදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව,

(i) රජයට අයත් සමාගම්;

(ii) අර්ධ රාජ්‍ය ආයතන;

(iii) පෞද්ගලික අංශය;

(iv) කර්මාන්ත අංශය;

(v) කෘෂිකර්මාන්ත අංශය;

(vi) සේවා අංශය;

අනුව සහ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

798/'16

11.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය මඟින් පිළිකා රෝහල් සංවර්ධනය සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(ii) පිළිකා ඒකක සංවර්ධනය සඳහා මුදල් වෙන්කර ඇති රෝහල් කවරේද;

(iii) දකුණු පළාත සඳහා පිහිටුවන පිළිකා රෝහල සඳහා වෙන්කරන ලද මුදල් ප්‍රතිපාදන, දැනටමත් පිළිකා ඒකකයක් සහිත කරාපිටිය ශික්ෂණ රෝහලේ පිළිකා ඒකකය සංවර්ධනය කිරීමට යොදවන ලෙස Sri Lanka College of Oncologists විසින් ඉල්ලා තිබේද;

(iv) එම ඉල්ලීම සාධාරණ බව පිළිගන්නේද;

(v) එසේ නම්, කරාපිටිය ශික්ෂණ රෝහලේ පිළිකා ඒකකය සංවර්ධනයට යොදවන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

803/'16

12.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත ප්‍රකාරව, ආබාධිත පුද්ගලයන්ට ප්‍රවේශ වී සේවාවන් ලබාගත හැකි පරිදි සේවා සැපයීම් කරනු ලබන සියලු රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්ට අයත් ගොඩනැගිලිවල ආබාධිත පුද්ගලයන් සඳහා විශේෂ ප්‍රවේශ පහසුකම් ඇතිකළ යුතු බවත්;

(ii) උක්ත පනත සම්මත කර වසර අටක කාලසීමාවක් ඇතුළත, රාජ්‍ය හා පෞද්ගලික සේවා සැපයීම් සිදුකරනු ලබන ගොඩනැගිලි සියල්ලෙහිම ආබාධිත පුද්ගලයන්ට ප්‍රවේශ වී සේවාවන් ලබාගත හැකි පරිදි එම පහසුකම් සලසා තිබිය යුතු බවත්;

(iii) රාජ්‍ය හා පෞද්ගලික සේවා සැපයීමේ ආයතනයන්හි මේ වනවිටද ඉහත සඳහන් පහසුකම් සලසා නොමැති තත්ත්වයක් දක්නට ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ආබාධිත පුද්ගලයන්ට පහසුවෙන් ප්‍රවේශ වී සිය අවශ්‍යතාවයන් සපුරාගැනීම සඳහා උක්ත පහසුකම් ඇතිකිරීමට පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

832/'16

13.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම රජයේ හා පළාත් රාජ්‍ය සේවයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල පවතින ගණකාධිකාරි තනතුරු හා ශ්‍රේණිවලට අදාළව තොරතුරු පද්ධතියක් සකස් කර තිබේද;

(ii) 2015 ජූනි 30 දිනට මධ්‍යම රජයේ හා පළාත් රාජ්‍ය සේවයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල පැවති මුළු ගණකාධිකාරි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (ii) හි සඳහන් පුරප්පාඩු පවතින ස්ථාන කවරේද;

(iv) 2015 දෙසැම්බර් 31 වනවිට ඉහත පුරප්පාඩුවලින් කොපමණ සංඛ්‍යාවක් පුරවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 දෙසැම්බර් 31 දිනට III වන ශ්‍රේණියේ අනුමත මුළු ගණකාධිකාරි තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) 2015 ජූනි 30 දිනට III වන ශ්‍රේණියේ අනුමත මුළු ගණකාධිකාරි තනතුරු සංඛ්‍යාව කොපමණද;

(iii) 2015 දෙසැම්බර් 31 දිනට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නැතත්, පවත්වාගෙන යනු ලබන III වන ශ්‍රේණියේ ගණකාධිකාරි තනතුරු සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

531/'16

14.

ගරු බුද්ධික පතිරණ මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය අවසන් වනවිට ශ්‍රී ලංකාව තුළ එළකිරි නිෂ්පාදනය තම ජීවිකාව කරගත් පිරිස කොපමණද;

(ii) 2015 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ එළකිරි නිෂ්පාදනය ලීටර් කොපමණද;

(iii) 2015 වසර අවසානයේදී ශ්‍රී ලංකාව තුළ සිටි එළවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එළුකිරි කර්මාන්තයේ නිරතවන්නන්ට එම කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය පහසුකම් රජය විසින් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම පහසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එළු ගහනය වැඩි කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

738/'16

15.

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2013, 2014 සහ 2015 වර්ෂවල කළුතර දිස්ත්‍රික්කය තුළ,

(i) ලියාපදිංචිව තිබූ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් (ETF) ගිණුම් සංඛ්‍යාව;

(ii) අලුතින් ලියාපදිංචි වූ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් (ETF) ගිණුම් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2013, 2014 සහ 2015 වර්ෂවල අලුතින් ලියාපදිංචි වූ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් (ETF) ගිණුම් සංඛ්‍යාව,

(i) රජයට අයත් සමාගම්;

(ii) අර්ධ රාජ්‍ය ආයතන;

(iii) පෞද්ගලික අංශය;

(iv) කර්මාන්ත අංශය;

(v) කෘෂිකර්මාන්ත අංශය;

(vi) සේවා අංශය;

අනුව සහ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව,— ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීමය තත්වය පවත්වාගෙන යාම සහ මෙහෙයවීම සඳහා වගකිවයුතු ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පිහිටුවීම සඳහා ද; ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 147 — වැඩසටහන 1,— † 2016 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භ වන හා 2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් දැනටමත් අනුමත කර ඇති වියදම් සීමා නොඉක්මවන පරිදි එහි විවිධ වැය ශීර්ෂ යටතේ අපේක්ෂිත ඉතිරිවීම් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වැය ශීර්ෂයේ "අයවැය සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතියට" මාරුකර ගැනීමටත් 2015 අංක 16 දරන විසර්ජන පනතේ 6.1 හා 6.2 වගන්ති මඟින් සලසා ඇති විධිවිධානවලට යටත්ව හඳුනාගත් විදේශ මූල්‍යකරණ සහිතව ක්‍රියාත්මකවන සංවර්ධන ව්‍යාපෘති කඩිනම් කිරීම සඳහා ප්‍රමුඛත්වය දෙමින් පරිපූරක ප්‍රතිපාදන ලෙස අදාළ අමාත්‍යාංශවලට මාරු කිරීමට හැකිවන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයට අයත් අනෙකුත් ඕනෑම අරමුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව විසින් මූල්‍යකරණය කරන ලද රුපියල් පනස්නව කෝටි විසිනව ලක්ෂ විසිපන්දහසක් (රු.592,925,000) නොඉක්මවන මුදලක් උපලේඛනයේ දක්වා ඇති ආකාරයට සලසා ගත යුතු ය.

**උපලේඛනය**

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 147 | - ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය | |
| වැඩ සටහන | 1 | - මෙහෙයුම් වැඩසටහන | |
| පුනරාවර්තන වියදම් | - | | රු. 469,425,000 |
| මූලධන වියදම් | - | | රු. 123,500,000 |
| | | මුළු වියදම = | **රු. 592,925,000** |

(රුපියල් පනස්නව කෝටි විසිනව ලක්ෂ විසිපන්දහසක් පමණි.)

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුම**

| | |
|---|---|
| උපරිම වියදම් සීමාව | - රු. 2,000,000 |
| අවම ලැබීම් සීමාව | - රු. 150,000 |
| උපරිම හර ශේෂ සීමාව | - රු. 3,500,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2016 අගෝස්තු මස 09 වැනි දින ඉදිරිපත් කරන ලද 2016 අංක 2 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 එකතුව රුපියල් 55,000,000.

*2.

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 මැයි 26 දිනැති අංක 1968/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.24 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ වැටුප හා දීමනා ප්‍රතිශෝධනය කිරීම,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (1) වගන්තිය අනුව කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් ඉටුකරලීම පිණිස එම කොමිෂන් සභාවට සහාය වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කිරීමට සහ එම තනතුර දරන තැනැත්තාට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන වැටුපක් ගෙවීමට විධිවිධාන සලස්වා දී ඇති හෙයින්ද;

අවදානමක් දැරිය යුතු තනතුරක් වන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට 2015.02.12 දින රජයේ අවශ්‍යතාවය මත නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් ධුරයේ රාජකාරි කළ ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය පත්කිරීම මත, ඇයට පෞද්ගලික වන සේ පහත සඳහන් වැටුප් හා දීමනා 2015.02.12 දින සිට ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරට හිමි මාසික වැටුප සහ සියලු දීමනා (දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව සහ නිවාස කුලී දීමනාව හැර);

සහ

(ආ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධුරයට හිමි අමාත්‍යාංශ ලේකම් දීමනාව, දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව හා රජයේ නිල නිවාසයක් ලබාදී නොමැති නම් නිවාස කුලී දීමනාව.

ඊට අනුකූලව, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයන් හා සාමාජිකයන් වෙත ගෙවනු ලබන පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා,— දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන් හා සාමාජිකයින් වෙත පහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා, අදාළ කොමිෂන් සභා සත්‍ය වශයෙන්ම රාජකාරි ආරම්භ කරන ලද දිනය, අදාළ ගෙවීම් බලාත්මක වන දිනය ලෙස සලකමින් ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) නිල බලයෙන් පත්වන සභාපතිවරයන් හැර අනෙකුත් සභාපතිවරයන් සඳහා රු. 100,000/-ක මාසික දීමනාවක් ද, රු. 10,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් සහ එකී වාහනය සඳහා ඉන්ධන ලීටර් 225ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්ද;

(ආ) නිල බලයෙන් පත්වන ස්වාධීන කොමිෂන් සභා සභාපතිවරයන් සඳහා තම නිත්‍ය තනතුරේ වැටුප් හා දීමනාවලට අතිරේකව, ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයෙකුගේ මාසික දීමනාවෙන් 50%ක මාසික දීමනාවක්ද;

(ඇ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ හැර අනෙකුත් ස්වාධීන කොමිෂන් සභාවල නිල බලයෙන් පත් නොවන සාමාජිකයින් සඳහා රු. 75,000/-ක මාසික දීමනාවක්ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, තම පදිංචි ස්ථානයේ සිට කොමිෂන් සභා කාර්යාලයට යාමට ඇති දුර ප්‍රමාණය අනුව කිලෝ මීටර් 350 දක්වා රු. 25,000/-ක ප්‍රවාහන දීමනාවක් හෝ කිලෝ මීටර් 350ට වැඩි දුර ප්‍රමාණයක් වෙනුවෙන් රු. 50,000/-ක ප්‍රවාහන දීමනාවක්ද;

(ඇ) 2015.06.17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 3/2015 විධිවිධාන පරිදි නිල බලයෙන් පත්වන සාමාජිකයින් සඳහා එක් රැස්වීම් වාරයකට සහභාගී වීම වෙනුවෙන් රු. 10,000/-ක දීමනාවක්ද;

(ඉ) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ (8) වැනි වගන්තියට අනුව එම කොමිෂන් සභාවේ සභාපතිට හා සමානව සාමාජිකයින්ට ද බලතල පැවරී ඇති බැවින්, එම කොමිෂන් සභාවේ සාමාජිකයින්ට රු. 95,000/-ක මාසික දීමනාවක් ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් හා එම වාහනය සඳහා ඉන්ධන ලීටර් 170ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්;

සහ

(ඊ) මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයින් වෙත, මැතිවරණයක් ප්‍රකාශයට පත් කළ දින සිට ප්‍රතිඵල නිකුත් කරන දින දක්වා වූ කාලසීමාව සඳහා ඔවුන්ගේ මාසික දීමනාවෙන් ¾ක විශේෂ දීමනාවක් ද.

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන්ට හා සාමාජිකයින්ට ඉහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

නීති කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා,— ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ නියෝග,— (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 63 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ (ඊ) ඡේදය යටතේ 2013 ඉඩම් අත්පත් කර ගැනීමේ (වන්දි ගෙවීමේ) නියෝග සංශෝධනය සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූලි 26 දිනැති අංක 1977/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 1),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූනි 13 දිනැති අංක 1971/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 2),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූනි 13 දිනැති අංක 1971/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 3),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූනි 28 දිනැති අංක 1973/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 4),—1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූලි 12 දිනැති අංක 1975/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*20.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 1),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1) උප වගන්තියේ (ඕ) (ක) සහ (ඝ) ඡේද යටතේ, ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1878/11 සහ 2014 සැප්තැම්බර් 01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*21.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 2),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14අ, 14ආ, 14ඇ, 14ඈ, 14ඉ, 14ඊ, 14උ, 14ඌ, 14එ, 14ඒ, 14ඔ, 14ඕ, 14ක සහ 14ග වගන්ති සමඟ කියවිය යුතු 61(1) (ත) වගන්තිය යටතේ, ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1878/12 සහ 2014 සැප්තැම්බර් 01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*22.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 3),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14අ, 14ආ, 14ඇ, 14ඈ, 14ඉ, 14ඊ, 14උ, 14ඌ, 14එ, 14ඒ, 14ඔ, 14ඕ, 14ක සහ 14ග වගන්ති සමඟ කියවිය යුතු 61(1) (ත) වගන්තිය යටතේ, ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1892/41 සහ 2014 දෙසැම්බර් 12 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*23.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 4),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ඌ) වගන්තිය යටතේ ස්වදේශ කටයුතු සහ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1904/10 සහ 2015 මාර්තු 03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*24.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 5),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ඝඋ), (ඝඌ) සහ (ත) වගන්ති යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1907/47 සහ 2015 මාර්තු 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*25.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 6),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ඕ) සහ (ත) වගන්ති යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1907/47 සහ 2015 මාර්තු 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*26.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 7),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 30 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1924/6 සහ 2015 ජුලි 20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*27.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 8),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 29 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1938/2 සහ 2015 ඔක්තෝබර් 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*28.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 9),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ත) වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1938/2 සහ 2015 ඔක්තෝබර් 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*29.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 10),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14අ, 14ආ, 14ඇ, 14ඈ, 14ඉ, 14ඊ, 14උ, 14ඌ, 14එ, 14ඒ, 14ඔ, 14ඕ, 14ක සහ 14ග වගන්ති සමඟ කියවිය යුතු, 61(1)(ත) වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1945/6 සහ 2015 දෙසැම්බර් 14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*30.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 11),—1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ත) වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1945/7 සහ 2015 දෙසැම්බර් 14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*31.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

32.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**